# කැරට්

## *ඩෝකස් කැරෝටා Daucus carota*

## කුලය - අම්බලිෆෙරී

### දේශගුණීක අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1300 ට වඩා ඉහල එසේම උෂ්ණත්වය සෙ.ග්‍රේ. 15-18 පවතින ප්‍රදේශවල කැරට් බෝගය ඉතා හොඳින් වගා කල හැකිය. එසේ වුවද මීටර් 1300 වඩා පහල හා මධ්‍යම ප්‍රදේශවලද සාර්ථකව වගාකළ හැකි සමහර කැරට් වර්ග තිබේ.

### පස

කැරට් වගාව සඳහා කාබනික ද්‍රව්‍ය බහුලව අඩංගු වැලි ලෝම් පසක් වඩාත් යෝග්‍ය වේ. සැමවිටම ගල් බොරළු වලින් තොර පසක් වීම වඩාත් සුදුසුය. ලංකාවේ දක්නට ලැබෙන රතු කහ පොඩ්සොලික් පස් වල කැරට් හොඳින් වගා කල හැකිය.

### බිම් සැකසීම

කැරට් වගාව සඳහා හොඳින් බිම සකසා ගත යුතුය. සෙ.මී. 20-30 ගැඹුරට සී සෑමෙන් හෝ කෙටීමෙන් පසු සියුම්ව පස සකස් කර ගන්න. මීටර් 1 පමණ පළල පාත්ති සකසා ගැනීම මගින් වගා නඩත්තුව පහසුවේ.

### නිර්දේශිත ප්‍රභේද

**ටොප් වේට් (මාස 4)**

කෝනාකාර හැඩයක් සහිත අලය, තැඹිලි පැහැතිය.

**කේප් මාර්කට් (මාස 3-3 1/2)**

සිලින්ඩරාකාර හැඩයක් ගන්නා අලය, ලා කහ පැහැයක් ගනී.

**නිව් කුරෝඩා (මාස 3-3 1/2)**

සිලින්ඩරාකාර හැඩයක් ඇති අල, තද තැඹිලි පැහැයක් ගනී.

දැනට ගොවීන් අතර වඩාත් ජනප්‍රිය වන්නේ නිව් කුරෝඩා වර්ගයයි. මෙම වර්ගය උඩරට මෙන්ම පහතරට ප්‍රදේශවලද වගා කිරීමට හැකියාව තිබේ.

### බීජ අවශ්‍යතාව

බීජ කි.ග්‍රෑ. 4 ක් පමණ හෙක්ටයාර් එකක් වගා කිරීමට අවශ්‍ය වේ.

### සිටුවීමේ කාලය

කැරට් බීජ එකවරම පාත්තිවල වැපිරිය යුතුය. මෙම වගාව යල සහ මහ කන්න දෙකෙහිම සිදු කල හැකිය. එසේ වුවද ජල සැපයුම සහ අනෙකුත් පහසුකම් අනුව මහ කන්නයේදී වැඩි වශයෙන් වගාවේ.

### පරතරය

කැරට් බීජ ක්ෂෙත්‍රයේ වැපිරීම ක්‍රම 2 කට සිදු වේ.

- පාත්තිවල විසුරුවා හැරීම.
- පේළි ක්‍රමයට ඉසීම. (සෙ.මී. 25 × සෙ.මී. 5).

බීජ පැලවී සති 3-4 කින් පැල තුනී කිරීම අවශ්‍ය වන අතර, සති 8 දී නියමිත පරතරයට සිටින සේ පැල තුනී කල යුතුය. පේළි ක්‍රමයට බීජ වැපිරීම මගින් පැල තුනී කිරීම හා වගාව නඩත්තු කිරීම පහසුවේ.

### පොහොර යෙදීම

හෙක්ටයාරයකට යෙදිය යුතු රසායනික පොහොර ප්‍රමාණය පහත දක්වා තිබේ.

| | යූරියා හෙ/කි.ග්‍රෑ. | ත්‍රිත්ව සුපර් පොස්පේට් හෙ/කි.ග්‍රෑ. | මියුරියේට් ඔෆ් පොටෑෂ් හෙ/කි.ග්‍රෑ. |
|---|---|---|---|
| මූලික පොහොර | - | 275 | - |
| සති 3 දී | 110 | - | 85 |
| සති 6 දී | 110 | - | 85 |
| සති 9 දී | 110 | - | 85 |

මීට අමතරව පාත්ති සකසා ගන්නා අවස්ථාවේදී කාබනික පොහොර (ගොම පොහොර හෝ කොම්පෝස්ට්) ටොන් 5 - 10 ක් පමණ හෙක්ටයාරයක් සඳහා යොදන්න.

### ජල සම්පාදනය

කැරට් පැලවල මුල් පද්ධතිය අවට මැනවින් තෙතමනය පවත්වා ගැනීමට ප්‍රමාණවත් වන ජල සැපයුමක් කල යුතුය. නියමිත ප්‍රමාණයට වඩා ජලය අඩු වුවහොත් අස්වැන්න අඩු වේ.

## වල් පැලෑටි පාලනය

අතින් වල් නෙලීම හෝ වල් නාශක භාවිතා කිරීමෙන් හෝ වල් පැල පාලනය කල හැකිය. මතුපිට පොහොර යෙදීමට කලින් වල් නෙලීම කිරීම කල යුතුය.

වල්නාශක ලෙස මෙට්‍රිබියුසින් (සෙන්කර්) හෙක්. කි.ග්‍රෑ. 0.35 බීජ පැලවීමට ප්‍රථමයෙන් පමණක් යෙදීම කළ හැකිය. මිශ්‍ර වගාවකදී වල්නාශක භාවිතා කිරීම නොකල යුතුය.

## රෝග හා පළිබෝධ පාලනය

කැරට් පත්‍ර අංගමාරය සහ බැක්ටීරියා මෘදු කුණුවීම සාමාන්‍යයෙන් වැළඳෙන රෝග වේ. තඹ මිශ්‍ර දිලීර නාශකයක් යෙදීමෙන් අංගමාරය වලකා ගත හැකිය. වැඩිපුර ජලය සැපයීමෙන් වැලකී සිටීමෙන් බැක්ටීරියා කුණුවීම වලකා ගත හැක. නොයෙක් දළඹු වගී, මයිටාවන්, කුඩිත්තන්, වේයන් වැනි කෘමීන් හානි නිර්දේශිත කෘමිනාශක යෙදීමෙන් පාලනය කල හැකිය.

## අස්වනු නෙලීම

කැරට් අලවල ඉහල කොටස සෙ.මී. 2.5 - 5.3 පමණ විශාල වූ පසු නෙලා ගත හැකිය. කැරට් අලයට හානි නොවන ආකාරයෙන් ගලවා ගත යුතුය.

## අස්වැන්න

ඉතා හොඳින් නඩත්තු කල වගාවකින් හෙක්. මෙ.ටො. 30-35 වඩා වැඩි අස්වැන්නක් ලබාගත හැකිය.

## පසු අස්වනු කටයුතු

කැරට් අල ගැලවීමෙන් පසුව හොඳින් පිරිසිදු කල යුතුය. පිරිසිදු ජලයෙන් සෝදා වෙළඳපල වෙත යැවිය යුතුය. බැක්ටීරියා විශේෂ අලවල රැඳී සිටීමෙන් කුණුවීම සිදුවිය හැකි නිසා සැලකිලිමත් විය යුතුය.